**ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ ක්ෂය රෝගය පාලනය සඳහා සංක්‍රාන්තික අරමුදල් යාන්ත්‍රණය සංරචකය- 2015**

ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් (ජීඑෆ්ඒටීඑම්) ව්‍යාපෘතියේ ක්ෂය රෝගය පාලනය සඳහා සංක්‍රාන්තික අරමුදල් යාන්ත්‍රණය සංරචකයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) හා ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල (GFTM) අතර 2013 ජූනි 19 දින එළඹි අංක එස් ආර් එල්-607-ජී 07-ටී දරන ප්‍රදාන ගිවිසුමේ සී (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, මූල්‍යයනය හා ව්‍යාපෘති කාලය

ප්‍රදාන ගිවිසුම අනුව, එවකට සෞඛ්‍ය අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම් දරයි. අඩු සේවා ප්‍රදේශවල ප්‍රජාවට සමීප වූ කාර්යයන් වැඩි කිරීම සහ රාජ්‍ය නොවන සංවිධාන හා පුද්ගලික අංශය සමඟ ප්‍රවර්ධනය කිරීම තුළින් සෘජු නිරීක්ෂණ ප්‍රතිකාර කෙටිකාලීන (DOTS) වැඩසටහනේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම මඟින් ශ්‍රී ලංකාවේ ක්ෂය රෝග පාලන වැඩසටහන ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. 06 වන වටය සඳහා ක්ෂය රෝග පාලනය ශක්තිමත් කිරීම සහ තාවකාලික අරමුදල් සැපයීම් යාන්ත්‍රණය සඳහා ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො 9,589,491 ක් වන අතර සම්පූර්ණ මුදලම මූල්‍යයනය කිරීම සඳහා ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල (ජීඑෆ්ඒටීඑම්) විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 ජනවාරි 01 දින ආරම්භ කර තිබූ අතර 2015 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා අරමුදල් සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 04 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 04 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලබන අනෙකුත් වාර්තාවල ඇතුළත් කරන ලද තොරතුරු සමඟ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති තොරතුරු එකඟ වන බව, සහ

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බවත්‍ය.

## 3. මූල්‍ය ප්‍රකාශන

### 3.1 මූල්‍ය කාර්යසාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම එජඩො 562,082 කට සමාන රු.76,453,217 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.934,037,083 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සාරාංශ කර පහත දැක්වේ.

| **විස්තරය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | | | **2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|---|---|
| | **2015** | | **2014** | | |
| | **එජඩො** | **රු.** | **එජඩො** | **රු.** | **රු.** |
| දේපල, පිරියත හා උපකරණ | 5,545 | 798,791 | 52,256 | 6,848,109 | 148,903,993 |
| ක්ෂය රෝගය පාලන කාර්යයන් | 556,537 | 75,654,426 | 843,545 | 110,133,241 | 785,133,090 |
| | 562,082 | 76,453,217 | 895,801 | 116,981,350 | 934,037,083 |

## 3.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය හා පෙර වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| **මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහය** | **2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | | **2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | |
|---|---|---|---|---|
| | **එජඩො** | **රු.** | **එජඩො** | **රු.** |
| විදේශාධාර - ප්‍රදාන වලින් ලැබුණු මුදල් | 389,884 | 53,000,000 | 689,338 | 90,000,000 |
| දේශීය අරමුදල්වලින් ලැබුණු මුදල් | 42,492 | 5,776,203 | 22,978 | 3,000,000 |
| ටෙන්ඩර් ආදායම | - | - | 230 | 30,000 |
| විදේශ විනිමය පාඩුව සඳහා ගැලපීම් | 7,002 | - | (698) | - |
| වැඩසටහන් වියදම් සඳහා ගෙවන ලද මුදල් | (556,537) | (75,654,426) | (525,776) | (68,645,183) |
| **ගැලපීම්** | | | | |
| වර්ෂය සඳහා අතිරික්තය/ (ඌනතාවය) | (117,159) | (16,878,223) | 186,072 | 24,384,817 |
| විදේශ විනිමය (පාඩුව)/ ලාභය | 3,406 | 490,707 | - | - |
| ගෙවිය යුතු මුදල් වැඩිවීම | 7,905 | 1,138,829 | 92 | 11,997 |
| ක්ෂය | 121,389 | 17,487,476 | - | - |
| පාරිතෝෂික | 8,459 | 1,218,656 | - | - |
| **මෙහෙයුම් කටයුතුවලින් ලැබුණු ශුද්ධ මුදල්** | 24,000 | 3,457,445 | 186,164 | 24,396,814 |
| **ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහය** | | | | |
| ස්ථාවර වත්කම් | (5,545) | (798,791) | (52,256) | (6,848,109) |
| ආයෝජන කටයුතුවල යෙදූ ශුද්ධ මුදල් | (5,545) | (798,791) | (52,256) | (6,848,109) |
| **මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහය** | | | | |
| අමාත්‍යාංශයට (භාණ්ඩාගාරයට) ආපසු ගෙවන ලද මුදල් | (18,455) | (2,658,654) | (133,908) | (17,548,705) |
| මූල්‍ය කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහය | (18,455) | (2,658,654) | (133,908) | (17,548,705) |
| මුදල්වල ශුද්ධ වැඩිවීම/ (ශුද්ධ අඩුවීම) | නැත | නැත | නැත | නැත |

## 4. විගණන නිරීක්ෂණ

### 4.1 ගිණුම්කරණ අඩුපාඩු

ව්‍යාපෘතියේ සේවකයින් 51 දෙනෙකු සඳහා 2015 දෙසැම්බර් 31 දිනට සේවාදායකයා විසින් ගෙවිය යුතු රු.මිලියන 8.01 ක් වූ සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා සේවා දායකය ගිණුම්ගත කරනු වෙනුවට අසම්භාව්‍ය බැරකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි.

### 4.2 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි අංක 371 (2)(ආ) හා සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) සහ 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ලබා ගන්නා ලද අත්තිකාරම එම කාර්යය නිම කළ වහාම නිරවුල් කළ යුතු වුවද, අවස්ථා 23 කදී ලබා ගත් එකතුව රු.874,125 ක් වූ අත්තිකාරම් මාස 01 සිට මාස 10 දක්වා වූ කාලයක ප්‍රමාදයන් සහිතව නිරවුල් කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි අංක 756 | රු.13,993,811 කට සමාන එජඩො 97,137 ක් වටිනා ස්ථාවර වත්කම්වලට අදාළව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ව්‍යාපෘතිය විසින් මිලදී ගන්නා ලද පරිගණක හා අදාළ මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය 4.3.2 ඡේදය | වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම යෝජනා ක්‍රම සඳහා දැනටමත් දායක වී ඇති නිලධාරීන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා 2015 ජනවාරි 01 දිනට රු.64,925 ක මුදලක් ප්‍රේෂණය කර තිබුණි. |
| (ඈ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය 5.4.11 ඡේදය | එකතු කළ අගය මත බදු ගෙවීම් විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඊළඟ මාසයේ 15 දිනට හෝ ඊට පෙර දැන්විය යුතුය. කෙසේ වුවද අවස්ථා 61 කදී කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද රු.මිලියන 3.09 ක් වූ එකතු කළ අගය මත බදු ඒ අනුව දන්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | ගෝලීය අරමුදලේ යොමුගත කොන්දේසි අංක 3 (vi) | අවස්ථා 05 කදී ඉන්ධන සඳහා කරන ලද ගෙවීම්වලට අදාළ රු.223,966 ක් වූ වවුචර් සමඟ ආධාරක ලියකියවිලි මුල් පිටපත් වෙනුවට ඡායා පිටපත් ඉදිරිපත් කර තිබුණි. |

## 5. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 5.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන, වර්ෂය තුළ ලැබුණු අරමුදල්, සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ සටහන් කැපීපෙනෙන සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | 2015 වර්ෂය සඳහා කරන ලද වෙන්කිරීම | වර්ෂය තුළ ලැබුණු අරමුදල් | | උපයෝජනය කළ අරමුදල් - 2015 වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් - 2015 දෙසැම්බර් 31 දක්වා | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජීඑෆ්ඒටීඑම් | 9.59 | 1,154.29 | 0.93 | 0.88 | 53.00 | 0.91 | 123.75 | 9.01 | 1,069.28 |
| | 9.59 | 1,154.29 | 0.93 | 0.88 | 53.00 | 0.91 | 123.75 | 9.01 | 1,069.28 |

### 5.2 භෞතික ප්‍රගතිය

#### 5.2.1 ක්ෂය රෝගය වැළඳුණු රෝගීන් හඳුනාගැනීම හා ප්‍රතිකාර කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද වාර්තා අනුව, දිස්ත්‍රික් 06 ක ක්ෂය රෝග රෝගීන් හඳුනාගැනීම සඳහා සිදු කරන ලද පරීක්ෂණ පිළිබඳ මන්දගාමී ප්‍රගතියක් වාර්තා විය. කෙසේ වුවද ක්ෂය රෝග රෝගීන් හඳුනා ගැනීම පිළිබඳ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් ලැබී නොතිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කරන ලද පැහැදිලි කිරීම අනුව, දුර්වල කාර්යසාධනය සඳහා හේතු ක්‍රමවත්ව තක්සේරු කර පළාත් සෞඛ්‍ය බලධාරීන් සමඟ කළහැකි මැදිහත්වීම් සාකච්ඡා කර ක්‍රියාමාර්ග ගන්නා ලද බව සඳහන් කර තිබුණි.

(ආ) ලය රෝග සායනවල පවත්වා ගෙන යනු ලබන, අතපසු කිරීම් නිරීක්ෂණය කිරීම සඳහා ලේඛනවලට (Registers for Defaulter Tracing) අනුව, ක්ෂය රෝගය සඳහා වෛද්‍ය ප්‍රතිකාර අඛණ්ඩව සිදු නොකරන රෝගීන්ගේ වැඩිම ප්‍රතිශතයන් යාපනය, මුලතිව්, කොළඹ, ගම්පහ හා නුවරඑළිය දිස්ත්‍රික්ක වලින් වාර්තා විය. ප්‍රතිකාර අතපසුකිරීමේ ඉහළ ප්‍රතිශතය අනුව, ක්ෂය රෝගය පැතිර යාමේ වැඩි ඉඩකඩක් හා ප්‍රතිකාර අතපසුකරන රෝගීන්ගේ සුවවීම දුරස්ථවීමක්ද පෙනී යයි. කෙසේ වුවද පරීක්ෂණ ඉහළ නැංවීම හා පළාත් සෞඛ්‍ය නිලධාරීන් සඳහා පුහුණුව ලබාදීම මඟින් අතපසුකිරීම් රේටය අවම කිරීම සඳහා අඛණ්ඩ පරිශ්‍රමයන් ගන්නා බව ව්‍යාපාති අධ්‍යක්ෂවරයා විසින් පැහැදිලි කර තිබුණි.

## 5.2.2 අන්වීක්ෂ භාවිත සේවා

ව්‍යාපෘතිය විසින් පිහිටුවන ලද අන්වීක්ෂ භාවිත මධ්‍යස්ථාන 185 න් 2015 දෙසැම්බර් 31 දිනට අන්වීක්ෂ භාවිත මධ්‍යස්ථාන 25 ක් ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. පාදුක්ක, හම්බන්තොට, මන්නාරම හා මුරුක්කන්හි අන්වීක්ෂ භාවිත මධ්‍යස්ථාන තාක්ෂණික නිලධාරීන් නොමැති වීම හේතුවෙන් වසා දමා පැවතුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් කරන ලද පැහැදිලි කිරීමට අනුව, හඳුනාගත් රෝගීන් සංඛ්‍යාව අඩු බැවින් හා කාර්ය මණ්ඩලය අඩු බැවින් සහ ළඟම ඇති අනිකුත් මධ්‍යස්ථාන සමඟ සම්බන්ධ කර ඇති බැවින් අන්වීක්ෂ මධ්‍යස්ථාන කිහිපයක් වසා දමා තිබුණි. විශාල වැඩ ප්‍රමාණයක් සහිතව උපකරණ හා අනිකුත් සම්පත් එම මධ්‍යස්ථාන වලට මාරු කර තිබුණි.

## 6. නිෂ්කාර්ය/ ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අර්ධ ස්වයංක්‍රීය ජෛව රසායන විශ්ලේෂක (Semi Automated Bio Chemistry Analyzer) 06 ක් රු.මිලියන 1.33 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් පියවර ගෙන තිබුණි. 2014 දෙසැම්බර් 08 දින කොන්ත්‍රාත්තුව නිම කිරීම සඳහා එකඟ වී තිබුණද, ඉන් ඒකක 04 ක් පමණක් 2015 පෙබරවාරි 11 දින සපයා තිබුණි. තවද, අවශ්‍ය රසායනික ද්‍රව්‍ය නොමැති වීම හේතුවෙන් ගාල්ල හා පුත්තලම ලය රෝග සායන සඳහා සවිකර තිබූ විශ්ලේෂක වර්ෂ 01 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

(ආ) රු.මිලියන 4.07 ක පිරිවැයකට ජාතික ක්ෂයරෝග පර්යේෂණ රසායනාගාරය හා දිස්ත්‍රික් ලය රෝග සායන සඳහා ව්‍යාපෘතිය විසින් එල්ඊඩී අන්වීක්ෂ (LED MICROSCOPES) 10 ක් ප්‍රසම්පාදනය කර තිබූ අතර, අන්වීක්ෂ ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණු කාර්ය මණ්ඩලය නොමැති වීම හේතුවෙන් 2014 ජුලි 18 දින ලැබී තිබුණු අන්වීක්ෂ 08 ක් 2016 මාර්තු 23 දක්වා ලය රෝග සායනවල නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) ගාල්ල, කරාපිටිය ශික්ෂණ රෝහලේ ඉදිකරන ලද ක්ෂය රෝග පිළිබඳ ක්ෂුද්‍ර ජීවී රසායනාගාරය (TB Culture Laboratory) අවශ්‍ය රසායනාගාර උපකරණ ප්‍රසම්පාදනය කර සවි නොකිරීම හේතුවෙන් 2014 ජුලි 16 සිට 2015 දෙසැම්බර් 31 දක්වා නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) විමර්ශන වාර්තා අනුව, 2015 දෙසැම්බර් 31 දිනට දීප ව්‍යාප්ත ලය රෝග සායන 16 ක ගබඩාවල දැනටමත් කල් ඉකුත් වූ හා කල් ඉකුත් වීමට ආසන්න ක්ෂය රෝග මර්දන ඖෂධ පැවති බව නිරීක්ෂණය විය. ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ පැහැදිලි කිරීමට අනුව, අඛණ්ඩ ප්‍රතිකාර සඳහා ඉක්මන් අවශ්‍යතාවය හේතුවෙන් ඉහළ මට්ටමක ස්වාරක්ෂක තොගයක් පවත්වා ගැනීමට අවශ්‍ය බව හා ඒ හේතුවෙන් ඖෂධවල වලංගු කාලය ඉක්මවීම දුෂ්කර බවත් සඳහන් කර තිබුණි. කෙසේ වුවද වාර්ෂික මිලදී ගැනීම් ඇණවුම් කොටස්වලට වෙන්කිරීම මඟින් හා ඖෂධ තොග කොටස්කර ලබා ගැනීම මඟින් පාඩුව අවම කර ගැනීමට පියවර ගත් බවත් සඳහන් කර තිබුණි.

**7. මානව සම්පත් කළමනාකරණය**

ක්ෂය රෝග මර්දන සහකාරවරුන් 80 දෙනෙකුගෙන් අනුමත කාර්ය මණ්ඩලය සමන්විත වුවත් නිලධාරීන් 69 දෙනෙකු පමණක් සමාලෝචිත වර්ෂය තුළදී සේවයේ යෙදී තිබුණි. ව්‍යාපෘතියේ ඉහළ සේවක පිරිවැටුම හේතුවෙන් දිස්ත්‍රික් ක්ෂය රෝග මර්දන මධ්‍යස්ථාන, ක්ෂුද්‍ර ජීවී රසායනාගාර හා අන්වීක්ෂ භාවිතා මධ්‍යස්ථානවල කාර්යයන් සතුටුදායක ලෙස ඉටු නොවන බව නිරීක්ෂණය විය. අඛණ්ඩව නිලධාරීන් අඩුවීම හේතුවෙන් ව්‍යාපෘති නිලධාරීන්, ගණකාධිකාරීවරුන්, ප්‍රසම්පාදන නිලධාරීන්, නියාමන හා ඇගයීම් නිලධාරී තනතුරු සමාලෝචිත වර්ෂය තුළ පුරප්පාඩු වී පැවතුණි.

**8. මූල්‍ය පාලන ගැටලු**

ව්‍යාපෘතියේ මෝටර් වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ පාලනයන් සතුටුදායක ලෙස ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය විය. ඉන්ධන බිල්පත්‍ර නිරවුල් කිරීමේදී මුදල් අයථා පරිහරණ අවස්ථා හා ධාවන වාර්තා පවත්වා ගැනීමේ දුර්වලතා ආදිය විගණනයේදී අඛණ්ඩව නිරීක්ෂණය කරන ලදී.